www.padanamapublication.lk

**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2012**
**පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රය.**

| ආර්ථික විද්‍යාව II | පැය තුනයි |
|---|---|

*සකස් කිරීම :- අධ්‍යාපන අමාත්‍යංශයේ මෙහෙයවීමෙන්*

**සැලකිය යුතුයි :**
**එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

PADANAMA PUBLICATION

## " අ " උප කොටස

01. i. කේන්ද්‍රීය ආර්ථික ප්‍රශ්නය වන "හිගකම" සංකල්පය විග්‍රහ කරන්න. (ලකුණු 04)

ii. පහත සංකල්ප නිර්වචනය කරන්න.
(අ) ආර්ථික සම්පත්
(ආ) ආර්ථික නොවන සම්පත්
(ඉ) ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත්
(ඊ) ප්‍රතිස්ථාපනය කළ නොහැකි සම්පත් (ලකුණු 04)

iii. පහත සඳහන් සිදුවීම් නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මගින් දක්වන්න.
(අ) ආර්ථික වෘද්ධිය
(ආ) ආර්ථික පසුබැසීම
(ඉ) ආර්ථික බිඳවැටීම
(ඊ) ආවස්ථික පිරිවැය
(උ) හිගකම (ලකුණු 05)

iv. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක ලක්ෂණ වලින් විධානගත ආර්ථික පද්ධතියක ලක්ෂණ කෙසේ වෙනස් වේ ද ? (ලකුණු 04)

v. ව්‍යවසායකයාගේ ප්‍රධාන කාර්යයන් නම් කරන්න. (ලකුණු 03)

02 i. පහත දැක්වෙන්නේ කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනයකි.

| මිල | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| 10 | 500 | 100 |
| 20 | 400 | 200 |
| 30 | 300 | 300 |
| 40 | 200 | 400 |
| 50 | 100 | 500 |

(අ) මෙම භාණ්ඩය මත රු.10 ක ඒකක සහනාධාරයක් ලබා දෙනු ලැබේ නම් ඉල්ලුම් සැපයුම් වක්‍ර ඇඳ වෙළෙඳපොළ සමතුලිතයට සහනාධාරයේ බලපෑම පෙන්නුම් කරන්න. (ලකුණු 02)
(ආ) සහනාධාරයෙන් පසු ගැනුම්කරු ගෙවන මිල හා නව සමතුලිත ප්‍රමාණය දක්වන්න.(ලකුණු 02)
(ඉ) සහනාධාරයෙන් පසු සැපයුම්කරුට ලැබෙන මිල දක්වන්න. (ලකුණු 02)
(ඊ) සහනාධාරය සඳහා රජය දරන වියදම ගණනය කරන්න. (ලකුණු 02)
(උ) සහනාධාරය නිසා අහිමි වූ ශුභසාධනය ගණනය කරන්න. (ලකුණු 02)

ii. පහත දැක්වෙන රූප සටහන **රජයේ අවම මිල ප්‍රතිපත්තියට** අදාළ වේ.




අවම මිල ප්‍රතිපත්තිය සමග පහත දැක්වෙන විකල්ප ක්‍රියාමාර්ග රජය විසින් ක්‍රියාත්මක කරන විට ඇති වන ප්‍රතිවිපාක දක්වන්න

(අ) රජය විසින් අතිරික්තය මිල දී ගැනීමේ දී අහිමි වී යන සමාජ ශුභසාධනය ඉහත රූප සටහනේ කවර අක්ෂරවලින් දැක්වේ ද ? (ලකුණු 02)

(ආ) ඌන පූර්ණ ගෙවීමේ මිල ආධාරක ප්‍රතිපත්තියක් අනුගමනය කරයි නම් අහිමි වී යන සමාජ ශුභසාධනය දැක්වෙන ප්‍රදේශය අක්ෂර මගින් දක්වන්න. (ලකුණු 02)

(ඉ) අතිරික්තය මිල දී ගැනීම සඳහා රජය දරන වියදම දැක්වෙන ප්‍රදේශය අක්ෂර මගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ඊ) ඌන පූර්ණ ගෙවීම් ක්‍රමය යටතේ නිෂ්පාදකයාගේ මුළු අයභාරය දැක්වෙන ප්‍රදේශයේ අක්ෂර දක්වන්න. (ලකුණු 02)

(උ) ඌන පූර්ණ ගෙවීම් ක්‍රමයෙන් පසු පාරිභෝගික පැහැදුම දැක්වෙන ප්‍රදේශයේ අක්ෂර දක්වන්න. (ලකුණු 02)

03 i. හීන වන ආන්තික ඵලදාව සහ අඩු වන පරිමාණානුකූල ඵල අතර වෙනස පෙන්වා දෙන්න (ලකුණු 04)

ii. දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියක දී සාමාන්‍ය පිරිවැය පහළ වැටෙනුයේ කවර සාධක නිසා ද ? (ලකුණු 03)

iii. නිෂ්පාදන ශ්‍රිතය යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 03)

iv. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක හා ඒකාධිකාරී තරග වෙළෙඳපොළක පොදු ලක්ෂණ කවරේද? (ලකුණු 03)

v. නිෂ්පාදන අතිරික්තය හා ආර්ථික ලාභය අතර වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 04)

vi. පූර්ණ තරගකාරී ආයතනයක ආන්තික අයභාරය හා සාමාන්‍ය අයභාරය අන්‍යෝන්‍ය ලෙස සමාන වන්නේ කවර හේතු නිසා ද ? (ලකුණු 03)

www.padanamapublication.lk

04 i. එක්තරා ආර්ථිකයක 2011 වසරේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(සියලු තොරතුරු රුපියල් මිලියනවලිනි.)

| | |
|---|---|
| කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය ( වෙළෙඳ පොළ මිල යටතේ ) | 17 |
| කාර්මික අංශයේ එකතු කළ අගය( වෙළෙඳ පොළ මිල යටතේ ) | 25 |
| සේවා අංශයේ එකතු කළ අගය( වෙළෙඳ පොළ මිල යටතේ ) | 30 |
| පෞද්ගලික පරිභෝජන වියදම් | 35 |
| රජයේ පරිභෝජන වියදම් | 15 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 25 |
| තොග පවනස් වීම් | 10 |
| ගම්‍ය මිල දර්ශකය (2005 = 100) | 150 |
| විදේශ ශුද්ධ සාධක ආදායම | -12 |
| 2010 මූර්ත දේශීය නිෂ්පාදිතය | 40 |

ඉහත දත්ත යොදා ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02)

(ආ) ශුද්ධ අපනයනය (ලකුණු 02)

(ඉ) දළ ජාතික නිෂ්පාදිතය (ලකුණු 02)

(ඊ) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 03)

(උ) ආර්ථික වර්ධන අනුපාතිකය (ලකුණු 02)

ii. වියදම් ප්‍රවේශය අනුව ජාතික ගිණුම් සැකසීමේ දී බැහැර කරන වියදම් වර්ග දක්වන්න.(ලකුණු 04)

iii. ජාතික ගිණුම් පිළියෙල කිරීමෙන් කිසියම් ආර්ථිකයකට ලැබිය හැකි ප්‍රයෝජන කවරේ ද ? (ලකුණු 03)

iv. රජය පෞද්ගලික අංශයෙන් ලබා ගත් ණය සඳහා ගෙවන පොලිය ජාතික ආදායමට ඇතුළත් කරනු ලබයි ද ? පැහැදිලි කරන්න. (ලකුණු 02)

05 i. "විවෘත ආර්ථිකයක ජාතික ආදායම් සමතුලිතය ආකාර දෙකකට පෙන්නුම් කළ හැකි ය." සම්මත සංකේත යොදාගනිමින් එම ක්‍රම දෙක පෙන්වන්න. (ලකුණු 02)

ii. සාමාන්‍ය පරිභෝජන නැඹියාව ( APC ) හා ආන්තික පරිභෝජන නැඹියාව ( MPC ) අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

iii. කල්පිත සංවෘත ආර්ථිකයක් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

C = 180 + 0.8 yd  I = 400  G = 300  T = 120

(අ) සමතුලිත ජාතික නිමැවුම ගණනය කරන්න. (ලකුණු 03)

(ආ) සමස්ත වියදම, සමස්ත විදීම් හා සමස්ත කාන්දු වීම් රේඛා ප්‍රස්තාරයක දක්වා සමතුලිත ආදායම පෙන්වන්න. (ලකුණු 04)

(ඉ) මෙම ආර්ථිකය සමතුලිත අවස්ථාවේ, රජයේ අය වැය ශේෂයත් එය සමනය කරන ආකාරයත් පෙන්වන්න. (ලකුණු 03)

(ඊ) ස්වාධීන වියදම් ගුණකය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

(උ) සමතුලිත නිමැවුම රුපියල් මිලියන 800 කින් ඉහළ දැමීමට, ආයෝජනය කෙතරම් ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතු ද ? (ලකුණු 02)

## “ ආ ” උප කොටස

06 i. මුදලේ කාර්යයන් කවරේද ? (ලකුණු 04)

ii. මුදලට ඉල්ලුමක් ඇති කරන්නේ කවර හේතු නිසා ද ? (ලකුණු 03)

iii. මුදල් සැපයුම ආශ්‍රිත පහත සංරචක අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

| | රුපියල් බිලියන |
|---|---|
| ❖ මහජනයා සතු ව්‍යවහාර මුදල් | 200 |
| ❖ මහජනයා සතු වාණිජ බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතු | 500 |
| ❖ මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 150 |
| ❖ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති නේවාසිකයින් සතු තැන්පතු | 100 |
| ❖ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | 100 |
| ❖ මහ බැංකුවේ ඇති වාණිජ බැංකු තැන්පතු | 140 |
| ❖ බලපත්‍රලාභි විශේෂිත බැංකුවල ඇති කාලීන හා ඉතුරුම් තැන්පතු | 75 |
| ❖ වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල් | 160 |

(අ) පදනම් මුදල් (සංචිත මුදල්) ගණනය කරන්න. (ලකුණු 02)
(ආ) පටු මුදල් සැපයුම ($M_1$) ගණනය කරන්න. (ලකුණු 02)
(ඉ) පුළුල් මුදල් සැපයුම ($M_2$) ගණනය කරන්න. (ලකුණු 02)
(ඊ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) ගණනය කරන්න. (ලකුණු 02)
(උ) මුදල් ගුණකය, ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම මගින් ගණනය කරන්න. (ලකුණු 02)

iv. උද්ධමනය, අවධමනය හා නිරුද්ධමනය යන සංකල්ප නිර්වචනය කරන්න (ලකුණු 03 )

07 i. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii. යහපත් බදු ක්‍රමයක දැකිය හැකි ගුණාංග කවරේ ද ? (ලකුණු 04)

iii. "බදු ප්‍රතිපත්තියක මූලික අරමුණ වන්නේ ආණ්ඩුවේ වියදම් පියවා ගැනීම පමණි".මෙම ප්‍රකාශයට ඔබ එකග වන්නේ ද ? හේතු දක්වන්න. (ලකුණු 04)

iv. ආර්ථික වර්ගීකරණය අනුව මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් සංයුතිය ප්‍රතිශතාත්මක ව දක්වන්න. (ලකුණු 03)

v. "මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයෙන් 7.9 %ක් විය".

(අ) මෑත කාලයේ අයවැය හිගය පියවීමට යොදා ගත් ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද ? (ලකුණු 02)

(ආ) අයවැය හිගය පුළුල් වීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද ? (ලකුණු 04)

08 සංයුක්ත සම්පත් ඒකකයකින් එක් එක් රට තුළ නිපදවිය හැකි නිමැවුම් ප්‍රමාණ පහත දැක්වේ.

| භාණ්ඩය | ඇමරිකා එක්සත් ජනපදය | කැනඩාව |
|---|---|---|
| තිරිගු (ඒකක) | 08 | 10 |
| රෙදි (ඒකක) | 04 | 20 |

i. තිරිගු හා රෙදි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි පවතින්නේ කවර රටවල ද ? හේතු සහිතව දක්වන්න. (ලකුණු 04)

ii. එක් එක් රටේ අභ්‍යන්තර හුවමාරු අනුපාත දක්වන්න. (ලකුණු 04)

iii. දෙරටට ම අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක හුවමාරුවක් ඇති වීමට නම් රටවල් අතර භාණ්ඩ හුවමාරු විය හැක්කේ කවර හුවමාරු අනුපාතික පරාසයක් තුළ ද ? (ලකුණු 04)

iv. මූර්ත විනිමය අනුපාතිකය යන්නෙන් කුමක් අදහස් වේ ද ? වෙළෙඳ ශේෂය වාසිදායක වීම සඳහා මූර්ත විනිමය අනුපාතිකය තීරණය කරන සාධක කෙසේ වෙනස් විය යුතු ද ? (ලකුණු 04)

v. ගෙවුම් ශේෂ අසමතුලිතතාවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ? දිගු කාලීන ගෙවුම් ශේෂ අතිරික්තයක ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද ? (ලකුණු 04)

09 i. ආර්ථික වෘද්ධිය ජනනය කරනු ලබන ප්‍රභවයන් තුනකි. ඒවා නම් කරන්න (ලකුණු 03)

ii. ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. ආදායම් ව්‍යාප්ති විෂමතාව මැනීමට යොදා ගන්නා නිර්ණායක හා දරිද්‍රතාව මිනුම් කිරීමට යොදා ගන්නා නිර්ණායක වෙන වෙනම දක්වන්න. (ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවයේ ප්‍රමාණය හා ස්වභාවය දක්වා දරිද්‍රතාවය අවම කිරීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහන් කරන්න. (ලකුණු 04)

v. "ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතර සේවා වියුක්තිය සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනී." මෙම ප්‍රකාශයට එකඟ වන්නේ ද ? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04)

10 i. මානව සංවර්ධනයේ දී යහපත් ජීවන තත්වයක් ළඟාකර ගැනීමට අවශ්‍ය සාධක කවරේ ද ? (ලකුණු 04)

ii. මානව සංවර්ධනය මැනීමේ සංයුක්ත දර්ශකයක් නම්කොට, එම දර්ශකය සකස් කිරීමට භාවිත කරන නිර්ණායක දක්වන්න (ලකුණු 04)

iii. විදේශ ඍජු ආයෝජන රටක සංවර්ධනය සඳහා දායක වන ආකාරය පෙන්වා දෙන්න.(ලකුණු 04)

iv. ඌන සේවා නියුක්තිය නිර්වචනය කොට එහි ආර්ථික ප්‍රතිවිපාක දක්වන්න. (ලකුණු 04)

v. විදේශ ආධාරවලට පක්ෂ ව හා විපක්ෂ ව ඉදිරිපත් වන තර්ක කවරේ ද ? (ලකුණු 04)

* * *

PADANAMA PUBLICATION